# 13 ශ්‍රේණිය - සිංහල 1

# ලකුණු බෙදී යාම.

(1)

(අ)

I. බමුණා ඇතුළු සියල්ලන්ගේ සිත පහදවා දෙව්ලොව සැප ලබා දීම.

II. කල්ප ලක්ෂයක් දුගතියට නොයයි. චිත්ත ප්‍රසාදය නිශ්චිතව පිහිට වෙයි.

III. සිතේ ප්‍රසාදය අපට ඒකාන්තයෙන් ම / ස්ථිර ව / නිසැක ව ම පිහිට වන්නේ වේ ද.

IV. හේතු විරහිත උපතක් ලබා ඇත. අලෝභ, අදෝස, අමෝහ යන හේතූන් රහිත ව උත්පත්තියක් ලැබීම.

(ලකුණු 01 × 4 = 04)

(ආ)

I. කර්මාන්විත වූ ව්‍යාධිය

II. සතර වාසලින් නික්ම ඖෂධයට ගත නොහැකි මුලක්, මලක්, පොතක්, අත්තක්, ඵලයක් සොයාගෙන ඒමට උපදෙස් ලබාදීම.

III. යන්තම් ටිකක් පමණ තැවරීමෙන් / ආලේප කිරීමෙන් අතුරුදහන් වන.

IV. කමර් + අන්විත ස්වරාදේශ සන්ධි පදයකි. / සමාන ස්වර දීසර්ය
පෙර ආත්මයකදී කරන ලද නරක කටයුත්තක් / කර්මය නිසා සැදුණා වූ

(ලකුණු 01 × 4 = 04)

(ඉ)

I. ඊ දණ්ඩක් ඇද රැගෙන විද

II. සොරුන් විසින් පිසින ලද මස් නොදී අමු මාංශ දුන්නේ යැ'යි කනස්සල්ලෙන් සිතීය.

III. වනයේ බිය උපදවන සුළු තුන් තැනින් මද වැගිරෙන හස්තියෙක් සිටී.

IV. වාත වේගයෙන්

(ලකුණු 01 × 4 = 04)

(ඊ)

I. බදු පඩුරු ලබාගැනීම.

II. කැළි කසළ ඉවත් කර අලංකාර කිරීම. / ධජ පතාක නැංවීම / දොරකඩක් පාසා පුණර්ඝට හා මාරුක් මලින් සැරසීම.

III. ආදායම් බදු දෙන ලෙස වැටුප් තානාන්තර ලබා දීම.

IV. පාර දෙපස සාදන පහන් පහන් වැට / පහන් සමූහය.

(ලකුණු 01 × 4 = 04)

(උ)

I. දුජර්න ගති දැක.

II. ගුරු උපදෙස් පිළිපැදීම. , මනාකොට ඉගෙනීම.

III. සිත් වූ පරිදි ඉගෙනගෙන මූසිල ගාන්ධර්වයා මෙසේ සිතීය.

IV. ගුරුතුමා ගේ උපදෙස්.

(ලකුණු 01 × 4 = 04)

(ඌ)

I. දඹදෙණි යුගය - ධර්මසේන හිමි - කුණ්ඩලකේසි වස්තුව
සැරියුත් හිමි විසින් පරිබ්‍රාජිකාවට වාද දහස අසා අවසන් වූ පසු පැවසූවකි.

II. දඹදෙණි යුගය - බුද්ධපුත්‍ර හිමි - අනුරුද්ද කුමාර කතාව
රජදරුවන් සියලු ආභරණ තමා අතට දී මහණ වීමට බුදුන් කරා ගිය පසු උපාලි කපුවාණන් තමා ද මහණ වීමට සිතන අවස්ථාවයි.

III. කුරුණෑගල යුගය - ජාතක පොත - චන්නකින්නර ජාතකය
ඡන්ද පවර්තයෙන් බැස පිහිටා කොට කොට අනතුරට පත් වීම හේතුවෙන් චන්ද්‍රකා සිදුවිය කිඳුරාට නැවතත් චන්ද්‍ර පවර්තයට යාමට ආරාධනා කරන අවස්ථාවයි.

IV. ගම්පල යුගය - ධර්මකීර්ති හිමි - සද්ධර්මාලංකාරය
රජතුමා ස්වර්ණතිලකා පියාගෙන් ස්වර්ණතිලකාගේ විවාහය පිළිබඳව විමසන අවස්ථාවයි.

V. බැද්දේගම - ලේනාඩ් වුල්ෆ්
හිරගේ අසල සිටි මහල්ලාට පුංචිමැණිකා පැවසූවකි.

VI. පේමතෝ ජායතී සෝකෝ - එදිරිවීර සරච්චන්ද්‍ර
ගෝල පිරිස උත්තර බමුණාට පවසන අවස්ථාවයි.

VII. නංගී කෙටිකතාව - ඇරැව්වල නන්දිමිත්‍ර

මව ඇගේ සොයුරාට තම වකුගඩු පරිත්‍යාග කිරීමට සූදානම් වන අවස්ථාවේ ප්‍රභා මවට පැවසූවකි.

(ලකුණු 03 × 4 = 12)

(එ) නාගල කන්ද - විමල් දිසානායක

- නිදහස් පරපුරේ ජී. බී. සේනානායක, සිරි ගුනසිංහ හා මහගමසේකර ගුණදාස අමරසේකර ගෙන් පසු අවධියේ ප්‍රමුඛ කවියා ය.
- සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් සාහිත්‍ය පෝෂණය කළ කවියාගෙ නාගල කන්ද ආකෘතියේ විශේෂතා අතර කවි අංකනය සුවිශේෂ ය.
- සරල බස, ප්‍රබල සංකේතාර්ථ දැනවීම ගැනීම, චිරන්තන කාව්‍ය බස යොදා ගැනීම. උපමා - රූපක යොදා ගැනීම නිසා සංකල්පරූප දනවන පද්‍ය පන්තියකි.

(ලකුණු 12 යි)

(2) සද්ධර්ම රත්නාවලියේ මට්ටකුණ්ඩලී හා කුණ්ඩලකේසි කතා වස්තුවල අපූර්ත්වයෙන් යුක්තව මාලෝපමා, රූපක, අනුප්‍රාසාත්මක යෙදුම් නිදසුන් මගින් පෙන්වා, චරිත උපේක්ෂාවෙන් සංකීර්ණ ලක්ෂණ සහිතව පෙන්වා මහා ජීවන දර්ශනයක් පිරිනමයි.

නැතහොත්

චන්දකින්නර චුල්ලධනුධර්ර ජාතක කතාවන්හි කිඳුරු රජ කිඳුරිය සමඟ පවර්ත පාද පාමුල ක්‍රීඩා කරන අවස්ථාව, ධනුධර්ර මාංශ ගෙන ඒමට බිරිඳ යවන අවස්ථාව, සොර දෙටු ස්ත්‍රිය දමා පලායන අවස්ථාව සජීවී ව නිරූපණය. චුල්ලධනුධර්ර ජාතකයේ දිසාපාමේ දියණිය, කුමරා සොරා සහා චන්දකින්නර ජාතකයේ රජු චරිතයන්හි සංකීර්ණ ලක්ෂණ පෙන්වා දිය යුතු ය.

(ලකුණු 15 යි)

(3) (අ) දඹදෙණි හා ගම්පොල යුගයන්හි ලියවුණු ගද්‍ය ග්‍රන්ථ හා කතුවරු පිළිබඳ ගුරු අත්පොතේ ඇත.

(ආ)

සද්ධර්මාලංකාරයේ ස්වණර්තිලකා වස්තුව හා නන්දි වානිජ වස්තුව ආශ්‍රයෙන් රටේ පාලනයට සම්බන්ධ පිරිස නියෝජනය කරමින් සීව ඇමති ශ්‍රද්ධාවන්ත පුද්ගලයකු මැරීමට තැත් කිරීම, අනුරාධපුරයේ ශ්‍රද්ධාවන්ත මවකගේ දියණිය මවට පරිභව කිරීම, ස්වර්ණතිලකා උද්දාල බමුණා වසග කරගැනීම, රජ කුමරුන් ගුරුවරයා බේරා ගැනීමට ස්වර්ණතිලකා මැරීම, ආශ්‍රයෙන් පුද්ගලයන් ක්‍රියාකාරකම්හි ආදීනවත්, නන්දිය වෙළෙන්දා

තුනුරුවන් පිහිට කොට ජීවත්වීම, අනුරපුර මවගේ දියණිය මල් මිටක් පූජා කිරීම, නන්දිය වෙළඳ භාර් යව පතිවත රැකීම ආදීයේ අනුහස් දැක්විය යුතුය.

නැතහොත්

පූජාවලිය අනුරුද්ධ කුමාර කථාව හා ජීවක කථාව ආශ්‍රයෙන් කුමාරවරුන්ගේ ජීවිතවල ජීවමාන ස්වරූපය කුඩා කළ ක්‍රීඩා කිරීම් ඇසුරින් පෙන්වා දිය හැකිය. ජීවක ගෙන් මව පිළිබඳව විමසීම, අනුරුද්ධ කුමාර ඇතුළු පිරිස බත් උපදින තැන විමසීම තුළින් කුඩා දරු ස්වරූපය ජීවමාන කර ඇති කාරය ද, අනුරුද්ධ කුමරු තමාගේ මිතුරන් ද සසර දුකින් මිදවීමට කටයුතු කිරීම, ජීවක ශාස්ත්‍ර ඉගෙනීමට සිතීම, කැපවීමෙන්, ඉගෙනීම, ඥානාන්විතව කටයුතු කිරීම ආදිය දැක්විය යුතු ය.

*ජීවමාන ස්වරූපය හා උසස් ගතිගුණ කතා දෙකෙන්ම ම පෙන්වා දී තිබිය යුතුය.

(ලකුණු 15 යි)

(4) ගුත්තිල කාව්‍යය

- අවස්ථාවට ගැළපෙන විරිත් භාවිතය පෙද විරිත (මාත්‍රා 16) වසන්ත විරිත (මාත්‍රා 12)  යොන්මත්වැල විරිත සහ ගී විරිත (මාත්‍රා 9 11 9 14) නිදසුන් දී තිබිය යුතු ය.
- උපමා රූපක පෙන්වාදී තිබිය යුතු ය.

(5) නවකතා

නවකතාවක අවස්ථා හා සිද්ධි නිරූපණය සලකා බැලීමේ දී, නවකතව කියවන විට ප්‍රාණවත් වූ අවස්ථා සිද්ධි තමා අභියස මැවෙන්නාසේ පාඨකයාට හැඟී යා යුතු අතර තමා ද එම අවස්ථා හා සිද්ධියේ හවුල්කරුවෙකු සේ හැඟී යා යුතු වය.

බැද්දේගම නවකතාවේ සිලිදු තම දරුවන් සුරතල් කරන අවස්ථාව (උඹේ මේ පුංචි බඩට ඇති වෙන්ට කෑම නැද්ද… ), පුංචි මැනිකා බබුන් කැලයේ හමුවූ අවස්ථාව (පුංචිමැණිකා, මේ උඹ හොයාගනයි මං මේ ආවෙ) බබුන් සිළිඳුට පුංචිමැණිකා පිළිබඳ යෝජනාව පවසන අවස්ථාව (සිලිදු මම ආවේ ඔබේ දූ පුංචිමැණිකා ගැන උඹත් එක්ක කතා කරන්න.) වෙදරාළ හා කරලිනා හාමි සිලිදුගේ අසනීපය කතා කරන අවස්ථාව (වෙද මහත්තයො අයියට ටිකක් අමාරුයි) ආ ආදී අවස්ථා හා සිද්ධි ඔස්සේ එහි සජීවී නවකතාවේ සාර්ථකත්වයට හේතු වූ බව පෙන්වා දිය යුතුය.

(ලකුණු 15 යි)

(6) කෙටි කතා

කෙටිකතාවේ සංකේත නිරූපණය ශිල්පීය අංගයක් ලෙස සැලකේ. කෙටිකතාකරුවාගේ විෂය ක්ෂේත්‍රය සීමා සහිත එකක් හේතුවෙන් අත්දැකීම සංක්ෂිප්ත ව චිත්‍රණය කිරීමට සංකේත ඉවහල් වේ.

ජී. බී. සේනානායක ගේ වෙසක් පහන කෙටිකතාව අද්දැකීමේ සිට ජීවන දෘෂ්ටිය දක්වා පාඨකයාට සමීප කර ඇත්තේ සංකේත නිරූපණයෙන් බව පිළිතුරෙන් නිදසුන් සහිතව පැහැදිළි කර තිබිය යුතුය.

(ලකුණු 15 යි)

(7) නූතන <u>පද්‍ය</u>

කොළඹ යුගයේ දෙවන පරපුරේ ජී. බී. අල්විස් පෙරේරා, සාගර පලන්සූරිය, මීමන ප්‍රේමතිලක, විමලරත්න කුමාරගම චන්ද්‍රරත්න මානවසිංහ, එච්. එම්. කුඩලිගම යන කවීන්ගේ කාව්‍යයන්ට වස්තු වියන්ට වස්තු විෂය වූයේ ප්‍රේමය, ස්වභාව සෞන්දර්යය, ගැමි දිවිය, කතා පුවත් කවියට නැගීම බව පෙන්වා දිය යුතුය.

භාෂාව භාවිතයේ දී සරල බස, සෞන්දර්යාත්මක බස, ජන කවි බස, වාර්තා ස්වරූපී බස භාවිත කර ඇති අන්දම නිදසුන් මගින් දැක්වීම අපේක්ෂා කෙරේ.

(ලකුණු 15 යි)

(8) පේමතෝ ජායතී සෝකෝ

සමාජ සම්මතයන් හා මානව චිත්තවේග අතර ගැටුම උද්දාල බමුණාගේ චරිතය, ස්වර්ණතිලකාගේ චරිතය හා සිසුන්ගේ චරිත තුළින් නිදසුන් ගෙන පැහැදිලි කළ යුතුය.

(ලකුණු 15 යි)